**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 04 දින නගර සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාව වෙත ලබාදී තිබූ බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.265,000 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) බණ්ඩාරවෙල මහජන බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් අංක 037-2-001-6-0019583 දරන කාලීන තැන්පතුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු.554,385 ක පොළී ආදායම ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2014 දෙසැම්බර් 31 දිනට මුදල්, මුදල් හා සමානදෑ වල වටිනාකම රු.554,385 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයට අදාල රු.7,576,443 ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.7,576,443 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) විශේෂ කඩිනම් ග්‍රාමීය සංචාර වැඩසටහන - 2014 යටතේ ක්‍රියාත්මක කරන ලද බිඳුණුවැව බදුළුගස්තැන්න මාර්ගය කොන්ක්‍රිට් කිරීමේ කර්මාන්තයේ නිමි වැඩ වටිනාකම රු.478,096 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දිනට රු.500,000 ක් වෙනුවෙන් කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් හා කර්මාන්ත ණයහිමියන් රු.21,904 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඉණිකම්බැද්ද ප්‍රජා ශාලාවේ නාන කාමරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.161,778 ක් වුවත්, රු.311,332 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.149,554 ක් අඩුවෙන් ද, 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) මළාපවහන කාණු පද්ධතිය වැඩිදියුණු කිරීමේ කර්මාන්තය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගන්නා ලද ණයමුදලට අදාලව 2006 ඔක්තෝබර් 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.2,216,268 ක හා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.237,732 ක පොලී මුදල් ගිණුම්ගත නොකිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමි ගිණුමේ ශේෂය රු.2,454,000 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

එක් ගිණුම් විෂයයකට අදාලව පාලන ගිණුම හා උපයෝගී ලේඛන අනුව ශේෂය රු.2,828,817 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.11,129,692 ක් වූයෙන් රු.8,300,875 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 107,385,894 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.87,251,857 ක් විය.

### 1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.153,046,882 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

මූල්‍ය බලතල පැවරීමකින් තොරව සභාවේ කාර්මික නිලධාරියා විසින් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 138 විධිවිධාන වලට පටහැනිව අවස්ථා 23 කදී වටිනාකම රු.11,152,388 ක් වූ වවුචර්පත් සහතික කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,355,602 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,540,553 ක් විය. ඒ අනුව රු.1,815,049 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 60,250 |
| මුද්දර ගාස්තු | 1,322,000 |
| | 1,382,250 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අවස්ථා 04 කදී නිකුත් කරන ලද වටිනාකම රු.31,295 ක් වූ ඩීසල් ලීටර් 258 ක් ධාවන සටහන්වලට ඇතුළත් කර නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**
**-----------------------------------------**

සභාව සතු පහත සඳහන් වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව සභා අංගනයේ රඳවා තිබුණි.

I. 74-4315 කුබෝටා අත් ට්‍රැක්ටරය

II. 49-8519 මැසි ෆර්ගියුෂන් ට්‍රැක්ටරය

III. 48-4128 ගලි බවුසරය

4. **පද්ධති හා පාලන**
**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය